Department of Education, Sabaragamuwa Province/ Weekly School Department of Education, Sabaragamuwa Province/ Weekly School Department of

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

ශ්‍රේණිය - 10

විෂය - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

සතිය - මාර්තු 04 සතිය

(01) "ශක්ති කන්ස්ට්‍රක්ෂන්ස්" නමින්, පදිංචිය සඳහා ගෙවල් ඉදිකර දීමේ ව්‍යාපාරයක් පවත්වා ගෙන යන ශක්තිට 2016 වර්ෂයේදී හොඳම ඉදිකිරීමේ සම්මානය හිමි විය. ශක්ති තමා විසින් ම පුළුස්සා සකස් කර ගන්නා ගඩොල් පමණක් සිය ඉදිකිරීම් කටයුතු සඳහා භාවිතා කරයි.

මෙම සිද්ධියේ සඳහන් "ශක්ති කන්ස්ට්‍රක්ෂන්ස්" ව්‍යාපාරය විසින් සපුරාලනු ලබන මූලික මිනිස් අවශ්‍යතාව කුමක්ද ?

1 ආහාර 2 ඇඳුම් 3 නිවාස 4 අධ්‍යාපනය

(02) "ශක්ති කන්ස්ට්‍රක්ෂන්ස්" ව්‍යාපාරය විසින් භාවිතා කරනු ලබන ගඩොල් අයත් වන නිෂ්පාදන සාධකය වනුයේ,

1 භූමිය ය. 2 ශ්‍රමය ය. 3 ප්‍රාග්ධනය ය. 4 ව්‍යවසායකත්වයය.

(03) ව්‍යාපාර කටයුතු කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශවයන්හි අරමුණු කීපයක් පහත දැක්වේ.

A - සාධාරණ වැටුපක් ලබා ගැනීම.
B - බදු අය කර ගැනීම.
C - අඛණ්ඩව ඇණවුම් ලබා ගැනීම.

ඉහත A, B හා C යන අරමුණු ඉටු කර ගැනීමට උනන්දුවක් දක්වන පාර්ශව පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

1. සේවකයෝ, රජය, සැපයුම්කරුවෝ
2. සේවකයෝ, අයිතිකරුවෝ, සැපයුම්කරුවෝ
3. සේවකයෝ, මූල්‍ය ආයතන, තරගකරුවෝ
4. කළමනාකරුවෝ, රජය, අයිතිකරුවෝ

(04) (i) (අ) මිනිස් වුවමනාවක් යනු කුමක්ද ?

(ආ) මිනිස් වුවමනාවක ලක්ෂණ දෙකක් ලියන්න.

(ii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍යද අසත්‍යද** යන්න දක්වන්න.

(අ) ව්‍යාපාරිකයින්ට මිනිස් අවශ්‍යතා නිර්මාණය කළ හැකි අතර, මිනිස් වුවමනා නිර්මාණය කළ නොහැකිය. (.................)

(ආ) ව්‍යාපාර සෑම විටම ලාභ අරමුණු කරගෙන කටයුතු කරයි. (................)

(iii) කොග්ගල පදිංචි සුමනා කාන්තිගේද සහාය ඇතිව තම ඉඩමක කුරුඳු වගා කර නිෂ්පාදනය කර මඩොල්දූව නැරඹීමට පැමිණෙන සංචාරකයන්ට, නගරයේ වෙළෙඳසැල්වලට හා දේශීය පාරිභෝගියන්ට අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වා ගෙන යයි.

(අ) 'හෙළ කුරුඳු තේ' ව්‍යාපාරයේ ඇල්මැති පාර්ශව වන සේවකයන් හා ණයදෙනුකරුවන් සඳහා සිද්ධියේ ඇතුලත් නිදසුන බැගින් ලියන්න.

(ආ) ඉහත iii (අ) සඳහා ඔබ සඳහන් කළ එක් එක් ඇල්මැති පාර්ශවය, 'හෙළ කුරුඳු තේ' ව්‍යාපාරය කෙරෙහි උනන්දුවක් දැක්වීමට හේතුව බැගින් ලියන්න.

(iv) පහත දැක්වෙන්නේ ව්‍යාපාර නාම කීපයකි.

1. ශක්ති බතික් නිෂ්පාදතයෝ
2. සකුරා බිම්මල්
3. සුවය ආරෝග්‍ය ශාලාව
4. සාගර රියදුරු පාසල

(අ) ඉහත එක් එක් ව්‍යාපාරය විසින් සපුරාලනු ලබන මිනිස් අවශ්‍යතාව ලියන්න.

(ආ) ඉහත එක් එක් ව්‍යාපාරය නිෂ්පාදිතයේ ස්වභාවය අනුව අයත් වන ව්‍යාපාර වර්ගය සඳහන් කරන්න.